

## ඔබට ප්‍රතිලාභ

පූර්ණ කැපවීමෙන් යුතුව ඔබ මෙම පාඨමාලාව සාර්ථක ව නිමා කළ කල්හි

- රාජකාරි සහ සමාජ කටයුතුවල දී දෙමළ බස කථා කරන්නන් සමග දෙමළ බසින් කථා කිරීමේ
- දෙමළ ජනතාවගේ සංස්කෘතික පසුබිම හඳුනා ගෙන ගෞරවාන්විත අයුරින් දෙමළ බස කථා කරන්නන් සමග සන්නිවේදනය කිරීමේ
- දෙමළ බසින් ලිවීමට සහ දෙමළ භාෂාවෙන් ලියැවුණු ඕනෑම ලේඛනයක් කියවීමේ

කුසලතාවන්ගෙන් පරිපූර්ණ වනු ඇත.

එමගින්

- රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ IV සහ III මට්ටම් සඳහා පෙනී සිටීමේ හැකියාව ද ලබා ගත හැකි ය.

**වැඩි විස්තර සඳහා**


සිංහල අධ්‍යයන අංශය
ශාස්ත්‍ර පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
රීඩ් මාවත
කොළඹ 07.

පාඨමාලා සමායෝජක: 0779069127
අධ්‍යයන අංශය 0112-500453
අන්තර් ජාලය: arts.cmb.ac.lk


# பேச்சுத் தமிழ் சான்றிதழ் பாடநெறி
குழு 11
(குறுகிய காலம்)

# *කථන දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව*
*කණ්ඩායම 11*
*(කෙටිකාලීන)*


සිංහල අධ්‍යයන අංශය
ශාස්ත්‍ර පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

## *කථන දෙමළ භාෂා පාඨමාලාව (කෙටිකාලීන)*

- **කා සඳහාද:**

**දෙමළ බසින් සවන්දීම සහ කථා කිරීම, කියවීම සහ ලිවීම යන දෙමළ භාෂා කුසලතා ප්‍රවර්ධනය කර ගැනීමට අභිලාෂයක් දක්වන්නා වූ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්, අතිරේක බසක් වසයෙන් දෙමළ බස උගන්වන ගුරු භවතුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය - ශිෂ්‍යාවන් සහ අනෙකුත් අය සඳහා ය. (කිසිදු දෙමළ භාෂා දැනුමක් අවශ්‍ය නො වේ.) මෙම පාඨමාලාව සාර්ථක ව නිමකරන විද්‍යාර්ථීන්ට පිළිගත් සහතිකයක් ප්‍රදානය කරන අතර ලේඛන දෙමළ භාෂා පාඨමාලාව හැදෑරීමට ද පුළුවන.**

### 1. හැඳින්වීම

මෙම පාඨමාලාව ඉලක්ක කොට ඇත්තේ දෙමළ බසින් කථා කිරීමට අභිලාෂයක් දක්වන්නන්ට දෙමළ බසින් සන්නිවේදනය කිරීමේ පුහුණුව සම්පාදනය කිරීම සඳහා ය.

**එහෙයින් මෙම පාඨමාලාවේ ඉලක්ක කණ්ඩායම වන්නේ කථන** දෙමළ **භාෂා කුසලතා මූල සිට වර්ධනය කර ගැනීමට අභිලාෂයක් ඇත්තා වූ අවුරුදු 17 ට වැඩි විද්‍යාර්ථීන් ය.**

දෙමළ බසින් කථා කිරීමෙන් සිංහල සහ දෙමළ බස කථා කරන්නන් අතර අන්තර් සම්බන්ධතාව ගොඩනගමින් ජාතික සංහිඳියාව ඇති කිරීමට ද මෙය චක්‍ර ව දායක වනු ඇත.

### 2. අරමුණු හා

මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ සවන් දීම, කථා කිරීම, ලිවීම, කියවීම යන දෙමළ භාෂා කුසලතා මූල සිට වර්ධනය කිරීම යි.

1. දෙමළ භාෂා ශබ්ද සහ සංකේත (අකුරු), හඳුන්වා දීම

2. විද්‍යාර්ථීන්ට වේලාව, පිහිටීම, දිශාව, දුර, දෛනික ගතිපැවතුම්, සමාජ සංසිද්ධි සහ කාර්යාලීය කටයුතු විමසීමටත් පැවසීමටත් අවශ්‍ය දෙමළ භාෂා වාග් මාලාව සහ වාක්‍ය රටා භාවිත කරමින් කථන කුසලතා වර්ධනය කිරීම

### 3. ඉගෙනුම් විධික්‍රමය

- පරිපූර්ණ ව ම ඉගෙනුම් කේන්ද්‍රීය සන්නිවේදන විධික්‍රම උපයෝග කර ගනු ලබන ප්‍රවේශයකින් දෙමළ භාෂා පුහුණු කාර්යය සිදු කෙරේ.
- **වර්තමාන රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ IV සහ III මට්ටමට අදාළ විෂය නිර්දේශයට අනුකූල ව ඉගැන්වේ.**
- මෙම පුහුණු වීම් කාර්යය සඳහා සම්මුඛ සැසි (face to face sessions) කණ්ඩායම් ක්‍රියාකාරකම් (group activities), යුගල ක්‍රියාකාරකම් (Pair works) සහ ඒක පුද්ගල ක්‍රියාකාරකම් (Individual activities) භාවිත කෙරේ..

### 4. අධ්‍යයන උපකාරක

කථන දෙමළ භාෂා පුහුණුව සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ IV සහ III මට්ටමේ විෂය නිර්දේශයට අනුකූල ව සැකැසුණු ක්‍රියාකාරකම් සහිත විශේෂ අධ්‍යයන ආධාරක 15 ක් භාවිත කෙරේ. (එක් අධ්‍යයන ආධාරකයක් පැය 04 කි.)

### 5. පාඨමාලා කාලය

පාඨමාලාවේ පුහුණු කිරීම් කාලය පැය 60 කි. ර්ට අතිරේක ව සපයනු ලබන ආධාරක උපයෝග කොට ගෙන විද්‍යාර්ථීයා පැය 60 ක අතිරේක කාලයක් ස්වයං අධ්‍යයනෙහි නිරත ව පුහුණු වීම්වල නිරත විය යුතු ය. ක්‍රියාකාරකම් කළ යුතු ය.

### 6. පන්ති පැවැත්වීම

**ඉරිදා දිනවල** පෙ.ව 09.00 – 01. 00

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨ ගොඩනැගිල්ලේ දී

### 7. උපදේශන මාධ්‍යය

සිංහල

### 8. පාඨමාලා ගාස්තුව

| | |
|---|---|
| පාඨමාලා ගාස්තුව: (අධ්‍යයන උපකාරක සහිතව) | රු.17,000/- |
| අයදුම් පත්‍ර ගාස්තුව: | රු. 500/- |
| ලියාපදිංචි ගාස්තුව: | රු. 1000/- |
| **මුළු පාඨමාලා ගාස්තුව** | **රු .18,500/-** |

**මුළු පාඨමාලා ගාස්තුව වාරික 2 කින් ගෙවිය හැකි ය. පළමුවෙනි වාරිකය වශයෙන් රු. 10,000/- ක මුදල ලියා පදිංචි අවස්ථාවේ දී ගෙවිය යුතු ය. දෙවෙනි වාරිකය වන රු. 8,000/- ක මුදල මසක් ඇතුළත ගෙවිය යුතු ය. නැතහොත් ශිෂ්‍ය භාවය අවලංගු කෙරේ .**

## 9. ඇගයීම් ක්‍රමය

සහභාගිවන්නන්ගේ භාෂා කුසලතා ප්‍රවර්ධනය අඛණ්ඩ ව මතු දැක්වෙන අයුරු ඇගයේ..

- මුද්‍රිත අධ්‍යයන ආධාරක උපයෝග කොට ගෙන සතිපතා කෙරෙන පුහුණු කිරීම්වලට අදාළ ව එම අධ්‍යයන ආධාරකවලින් පැවරෙන ඇගයීම්ලින්.
- පන්ති කාමරය තුළ දී කෙරෙන විශේෂ ඇගයීම්ලින්.
- විද්‍යාර්ථීන් වෙත සපයනු ලබන පැවරුම් 1 සහ 2 මගින්

## 10. අවසන් පරීක්ෂණය

- ලිඛිත පරීක්ෂණය ( පැය 02)
- වාචික පරීක්ෂණය ( එක් අයෙකුට විනාඩි 15 )

**අවසාන විභාගයට පෙනී සිටීම සඳහා 80% අවම පන්ති සහභාගිත්වයක් අනිවාර්ය වේ.**

## 11 අවසන් ප්‍රතිඵල

| | |
|---|---|
| පැවරුම් 2 න් | 10% |
| ලිඛිත පරීක්ෂණයෙන් | 35% |
| වාචික පරීක්ෂණයෙන් | 55% |
| | 100 |

## 12. සාමර්ථ

**0-39** දුර්වල 40-59 සාමාන්‍ය

60- 74 කුසලතා 75-100 විශිෂ්ට

## 13. සහතික පත්‍ර

ජාත්‍යන්තර ව පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන කොළඹ විශ්වවිද්‍යාලය විසින් රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

## 14. ආචාර්ය මණ්ඩලය

නූතන භාෂා ඉගැන්වීම් විධික්‍රම භාවිත කරමින් දිගු කාලයක් දෙමළ භාෂා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නියැළුණු ප්‍රවීණ බාහිර කථිකාචාර්යවරුන්

## 15 ඔබ එකග විය යුතු දෑ

පාඨමාලාවට ලියාපදිංචි වන ඔබ කොළඹ විශ්වවිද්‍යාලයේ ද පාඨමාලාවේ ද නීති රීති සහ කොන්දේසිවලට ද එකග විය යුතු ය

### පාඨමාලාවට ලියාපදිංචි වීම

☞ **ඔබගේ අයදුම්පත නිවැරදි ව සම්පූර්ණ කර**

මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් **කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට** බැරවන සේ **යොමු අංක** 304112400009 ට **රු.500.00** ගෙවා එම ලදු පත හා අයදුම්පත්‍රය 2019 අගෝස්තු 20 වෙනි දින හෝ ඊට පෙර කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සිංහල අධ්‍යයනාංශය වෙත පැමිණ භාර දිය හැකි ය. නැතහොත්,

**පාඨමාලා සමායෝජක, සිංහල අධ්‍යයන අංශය, ශාස්ත්‍රපීඨය,කොළඹ විශ්වවිද්‍යාලය, රීඩ් මාවත, කොළඹ 07.** යන ලිපිනයට අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ තැපැල් මගින් ද එවිය හැකි ය.

**අනතුරුව ලියා පදිංචිය සඳහා නොපමාව දන්වනු ලැබේ.**